# සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**නිවාඩු කාලීන පැවරුම්**

**සැකසුම-මාවනැල්ල අධ්‍යාපන කලාපය**

# 4 ශ්‍රේණිය - පරිසරය(පළමු සතිය)

## 12 තේමාව - මිනිස් හැසිරීම්

1. ඔබ වඩාත් කැමති නිර්මාණයක් පහත සඳහන් මාධ්‍ය යටතේ නිර්මාණය කරන්න.
   චිත්‍ර, කොලාජ්,මෝස්තර,ඇඹීම ,නෙලීම.

2. ඔබ කල නිර්මාණය පවුලේ සාමාජිකයන්ට පෙන්වා අදහස් විමසන්න.

3. ගීතය
   පුංචි සිතේ පුංචි සිනා වෙල් ඉපනැල්ලේ
   රංචු ගැසී හාද වෙලා මල් හසරැල්ලේ

   පුංචි දේට කතාවෙලා -රණ්ඩුවෙලා වෛර බැඳන්
   කතා නොමැති ගෙවල් තුනක දූලා පුතාලා
   අම්මලාට හොරෙන් ඇවිත් සෙනෙහෙ සිතින් යාළුවෙලා
   පුංචි පැටවු එක පවුලකි වෙල් ඉපනැල්ලේ

   දෙමාපියන් කතා නැතුව වෛරවුනත් ඒ වාගේ
   පුංචි සිතේ වස විස නේ ලොකු සිත් වගේ
   මල් වාගේ දූවේ පුතේ ලොකු යටත් ඇදගහලා
   ජීවිතයේ කතාන්දරය කියා දියන්නේ

   ගීතය ඇසුරෙන් පහත ප්‍රකාශයන් හරි නම් (√) ලකුණ ද වැරදි නම් (×) ලකුණද වරහන් තුල යොදන්න.
   1.මල් හසරැලි පාන්නේ දෙමව්පියන්ය.( )
   2.රණ්ඩු වෙලා වෛර බැදන් සිටින්නේ ළමයින්ය.( )
   3.සෙනෙහෙ සිතින් යාළුවෙලා සිටින්නේ පුංචි පැටවුන්ය. ( )
   4.පුංචි සිතේ වස විස ඇත. ( )
   5.ජීවිතයේ කතන්දරේ කියා දියන්නේ. ( )

4. පහත සඳහන් සුබ පැතුම් පත් වලින් ඔබ කැමති සුබ පැතුම් පතක් නිර්මාණය කරන්න.
   - උපන්දින සුබ පැතුම් පතක්
   - වෙසක් පත්
   - ස්තුති කිරීමේ
   - ඉක්මන් සුවය පතා යවන පතක්

5. ඔබ කැමති මාතෘකාවක් යටතේ කවියක හෝ කතාවක් නිර්මාණය කරන්න.